**ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2018**
**-----------------------------------------------------------**

**තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

## 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දායක මුදල් ලැබීම් | රු. 66,918,348 | පිරිවෙන් හා පෞද්ගලික / උපකෘත පාසැල්වල ගුරුවරුන්ගෙන් වැන්දඹු අනත්දරු දායකය හා ඔවුන් රාජ්‍ය නිලධාරීන් ලෙස පූර්ණ වශයෙන් පිළි නොගන්නා බැවින් විශ්‍රාම වැටුපට මාසික වැටුපෙන් සියයට 6 බැගින් වෙන වෙනම දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවිය | මේ පිළිබඳ පැහැදිලි කරවා ගැනීමට හා දායක මුදලේ වර්ගීකරණයක් ගෙන්වා ගැනීමට ලිපියක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | මාසික ගිණුම් සාරාංශ මගින් බැර කර ඇති මුදල් කුමන දායකත්වය සඳහා බැර කරන ලද්දේදැයි නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |

යුතුය. එසේ වුවද අධ්‍යාපන අමාත්‍යාංශය ගිණුම් සාරාංශ මඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට 2018 වර්ෂයේදි පළාත් 3 ක් සඳහා බැර කරන ලද රු. 66,918,348 ක් වූ මුදල කුමන දායකත්වය සඳහාද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ අංක 9 (අ) නියෝගය | දායක මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයන් පවත්වා නොතිබුණි. | කේවල ගිණුම් ක්‍රමයක් පවත්වාගෙන යාම ප්‍රායෝගික නොවේ. | දායක මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුලත් ලේඛන පවත්වා ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.148,370,923 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.131,957,353 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,413,570 ක වර්ධනයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ගිණුමෙන් ගෙවීම නිසා විශ්‍රාම වැටුප් ගෙවීම් අඩුනොකිරීම හේතුවෙන් මෙම අතිරික්තය ඇති වී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු. 14,568,648 කින් හා දායක මුදල් ලැබීම් රු. 1,254,423 කින් ඉහළ යාම, ඉහත වර්ධනයට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ සාමාජිකයන් පිළිබඳ යාවත්කාලීන උපලේඛනයන් නඩත්තු නොකිරීම නිසා අරමුදලට ලැබිය යුතු හිඟ මුදල් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය කරගත නොහැකි විය. | පාසල්වල විශාල ගුරුවරු ප්‍රමාණයක් සිටින බැවින් මේ සඳහා වෙනම කාර්යය මණ්ඩලයක් අවශ්‍ය වේ. | අරමුදලේ සාමාජිකයන් පිළිබඳව යාවත්කාලීන උපලේඛණයක් නඩත්තු කල යුතු වීම. |
| (ආ) | දායක මුදල් ආපසු ගෙවීමේදී දායකයාගෙන් අයකරගත් මුදල් ප්‍රමාණය වර්යා සටහන පරීක්ෂා කර ගෙවීමට කටයුතු කළද, එම මුදල් නිවැරැදිව අරමුදල සඳහා ලැබුනේද යන්න තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. | වැන්දඹු අනත්දරු දායක මුදල් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ බවට ආයතන ප්‍රධානියාගෙන් සහතික කර ගැනීමෙන් අනතුරුව වර්යා සටහන මඟින් සසඳා ගෙවීම් කරනු ලැබේ. | දායක මුදල් අරමුදල වෙත නිශ්චිත ලෙස ලැබුනේදැයි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුලින් තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |
| (ඇ) | 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත් නියෝග අංක 04 ප්‍රකාරව ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල්වලින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කළ යුතුයි. එසේ වුවද දායක මුදල් රැස් කිරිම හා ගෙවීම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබු අතර දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට රැස්කර තිබීම හා උක්ත වියදම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම් කිරීමත් හේතුවෙන් අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුවී නොතිබුණි. | 1953 වන විට මෙවැනි අරමුදලක් පැවතීම අත්‍යවශ්‍ය වුවත් වර්තමාන රාජ්‍ය හා මූල්‍ය ප්‍රතිපත්ති විධිවිධාන අනුව මෙම අරමුදල අත්‍යාවශ්‍ය නොවේ. | 1953 අංක 44 දරන විශ්‍රාම වැටුප් පනතේ නියෝග ප්‍රකාරව කටයුතු කිරිම හෝ වර්තමාන ප්‍රතිපත්ති හා විධිවිධානවල ගැලපෙන ලෙස ප්‍රතිසංවිධානය හෝ අවසන් කිරීම කටයුතු කල යුතු වීම. |